# වත්මන් දේශපාලන තත්වය පිළිබඳව බර්ලින් ශ්‍රී ලංකා සංගමයේ ප්‍රකාශය

Sri Lanka Association Berlin e.V.

ශ්‍රී ලංකාවේ තත්වය ඉතා තීරණාත්මක වූ අවස්ථා කිහිපයකදී පමණක් රටේ දේශපාලන තත්ත්වය පිළිබඳව බර්ලින් ශ්‍රී ලංකා සංගමය ප්‍රකාශ නිකුත් කර ඇත. නිදහසින් පසු ලක්ෂ ගණනක් ශ්‍රී ලාංකිකයන් පාරට බසිමින් රට අත්විදින වේදනාකාරීම පසුබෑමට විරෝධතාවය පලකරමින් ඊට මුහුණ දෙමින් සිටින වාතාවරනයක් තුළ, අපගේ සාමාජිකත්වයේ ඉල්ලීමට අනුකූලතාවය දක්වමින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරීමට විධායක කමිටුව තීරනය කරන ලදී.

ප්‍රධාන පෙළේ කූට, අදක්ෂ දේශපාලකයින් විසින් ප්‍රතිපාදනය කරන ලද දෝෂ සහිත ප්‍රතිපත්ති, වැරදි කළමනාකරණය සහ ප්‍රධාන වශයෙන් දූෂණය හේතුවෙන් ශ්‍රී ලංකාව වඩාත් දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. වාර්තාගත ඉහලම උද්ධමනය සහ නිරන්තර විදුලිය ඇනහිටීම් සමඟ අඛණ්ඩව ආහාර, ඖෂධ සහ ඉන්ධන හිඟය හේතුවෙන් වහාම ඉල්ලා අස්වන ලෙස ජනාධිපතිවරයාට සහ රජයට බල කරමින් පසුගිය සතියේ සිට ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයෝ දිවයිනේ සෑම ප්‍රදේශයකම විරෝධතා පවත්වති.

අප දිවයිනේ ආර්ථික අර්බුදය ඉතා ඉක්මනින් මානුෂීය අර්බුදයක් බවට පත් වී ඇත. අත්‍යවශ්‍ය සැපයුම්වල අඛණ්ඩතාවය තවදුරටත් සහතික නොවේ. ජනතාවට විදුලිය, ගෑස්, ආහාර සහ බෙහෙත් සැපයීම තව දුරටත් කරගෙන යෑමට නොහැකි තත්වයකට පත්ව ඇත. උද්ධමනය දශක ගණනාවක් තිස්සේ ඉහළම මට්ටමට පැමිණ තිබේ. 100% කාබනික ගොවිතැන් ප්‍රතිපත්තිය අස්වැන්න සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු වූ බැවින් ආහාර මිල පෙර නොවූ විරූ ලෙස ඉහළ යාම ද වැරදි උපදේශ මත ගොඩනගන ලද කෘෂිකාර්මික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකාවේ ජීවන රටාව, රැකියාවන්, ව්‍යාපාරික ලෝකය, අධ්‍යාපන ක්‍රමය සහ මිනිසුන්ගේ පවුල් ජීවිතය පවා දැඩි අභියෝගයකට ලක්වී ඇත. කොවිඩ් වසංගත තත්වය අපහසුතාවයන් උග්‍ර කර තිබුනද, සැබෑ අර්බුදය මෑත වසරවල දෝෂ සහිත ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයකි.

ආර්ථික අර්බුදය ආරම්භ වූයේ 2019 දී හඳුන්වා දුන් කාලෝචිත නොවන බදු සහන පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යයට ආදායම් අහිමි වීමත් සමඟ ය. මෙය ශ්‍රේණිගත කිරීමේ ආයතන කිහිපයක්

Gardeschützenweg 86, 12203 Berlin | www.srilankans-berlin.de | e-mail: info@srilankans-berlin.de
Bankverbindung: Commerzbank AG | IBAN: DE83 1008 0000 0312 9366 00 | BIC: DRESDEFF100
Gerichtstand: Amtsgericht Berlin Charlottenburg | 95 VR 6170 NZ

විසින් ශ්‍රී ලංකාව පුළුල් ලෙස පහත හෙළීමට හේතු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපහට ණය ගැනීමේ පිරිවැය වැඩි විය. ණය අර්බුදය හසුරුවා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍යය අරමුදලේ සහය ලබා නොගැනීමේ මුල් ස්ථාවර හේතුව, ඩොලරය සඳහා ඉහළ සීමාවක් නියම කිරීම සහ ශ්‍රී ලංකාවට නිල විදේශ මුදල් හුවමාරු කිරීම් සර්වකාලීන අවම මට්ටමකට අඩුවීම, අර්බුදය වේගවත් කළේය. ජාත්‍යන්තර මූල්‍යය අරමුදල සමග දිගුකාලීන විසඳුමක් සඳහා සාකච්ඡා කිරීම වෙනුවට වැඩි පොලී අනුපාත යටතේ ප්‍රතිපත්ති සංශෝදනයක් ඉල්ලා නොසිටින රටවලින් කෙටිකාලීන ණය ලබා ගැනීම සහ මුදල් හුවමාරු කරගැනීම මත රජය විශ්වාසය තැබීය. ඊට ප්‍රධානතම හේතුව වූයේ රජයේ දෝෂ සහිත දේශපාලනයට ලොව පිළිගත් ආයතන මැදිහත්වීම වැළැක්වීම තුලින් එක පවුලක් ඒකරාශී කරගත් බලය ආරක්ෂා කරගැනීම සහ එමගින් වංක ක්‍රියාවන් තව දුරටත් කරගැනීමේ වාතාවරනය ආරක්ෂා කර ගැනීමය.

වත්මන් රජයට රටේ පවතින ප්‍රශ්න විසඳා ගැනීමට හැකියාවක් නොමැති බව ඔප්පු වී ඇත. වත්මන් ආර්ථික, දේශපාලන හා සමාජීය අර්බුදය හසුරුවා ගැනීමට ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්ද ඇති භාරකාර ජනාධිපතිවරයෙකු මෙන්ම අන්තර් කාලීන අගමැතිවරයෙකු සහ වර්තමාන ගැටලු සඳහා අදාළ විෂය පථයන් පිළිබඳව දැනීමක් ඇති සහ පළපුරුදු සමාජ නිපුණතා ඇති සුදුසුකම්ලත් වෘත්තිකයන්ගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් පත් කරගැනීමට අඩිතාලම පාර්ලිමේන්තුව තුල සකස් කර ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ඉතා කඩිනමින් ඉවත්විය යුතුය. හැකි ඉක්මනින් රටට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, ණය මුදල් පිළිබඳව දිගුකාලීන ආපසු ගෙවීමේ සැලැස්මක් ජාත්‍යන්තර මූල්‍යය අරමුදල සමග සාකච්ඡා කිරීම සහ මාස 12 සිට18 දක්වා කාල පරාසය තුළ ආර්ථික ප්‍රකෘතිය සහ දිගුකාලීන වර්ධනය සඳහා ප්‍රධාන සැලැස්මක් සහ එය පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමේ අන්තර් කාලීන වැඩ පිළිවෙලක් සකස් කිරීම මෙම අන්තර්කාලීන රජයේ වගකීම විය යුතුය.

20 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර තිබූ ආකාරයටම පාර්ලිමේන්තුව සහ විධායකය අතර බල තුලනය යළි ස්ථාවර කිරීමටත්, පාර්ලිමේන්තුවේ කාර්යභාරය යළි ස්ථාපිත කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අන්තර්වාර රජය කටයුතු කිරීම ඉතා වැදගත් වේ. එසේම මෙම මාස 12 සිට 18 දක්වා කාලයෙන් පසු නව ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්විය යුත්තේ "වැඩිපුර ප්‍රජාතන්ත්‍රවාදය දිනවීමට" පෙලගැසෙන ජනවරමක් සහිතවය.

සති දෙකකට වැඩි කාලයක් තිස්සේ දස දහස් ගණනක් විරෝධතා දක්වමින් අයදින "පවතින ක්‍රමවේදය වෙනස් කිරීම" ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. මේ සඳහා වත්මන් ආණ්ඩුව මෙන්ම විපක්ෂයද මග සැලසිය යුතුය.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා බර්ලින් ශ්‍රී ලංකා සංගමය ජර්මනියේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් 188 දෙනෙකුගේ අත්සන් සහිතව ලිපියක් ජර්මනියේ

බර්ලින් තානාපති කාර්යාලය හරහා ජනාධිපතිවරයා වෙත යොමු කර ඇත. ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලංකා දූෂිත දේශපාලඥයින් ඇතුලු ඔවුන්ගේ සහයකයින්ගේ ගිණුම් පරීක්ෂා කරන ලෙස අයදමින් සහ ඊට හේතු කරුණු සනාත කරමින්, සංවිධානාත්මක අපරාධ සහ මුදල් විශුද්ධිකරණය මැඩලීම සඳහා කටයුතු කරන යුරෝපා සංවිධානයේ ක්‍රීයාංශය වෙතද ලිඛිතව දැනුම් දී ඇත. එසේම ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය පිළිබඳව අපගේ වෙබ් අඩවියේ ලිපියක් පළ කළ අතර ස්වාධීන හා අපක්ෂපාතී විරෝධතා රැලි කිහිපයකටද සහයෝගය දත්වා ඇත. එසේම ඖෂධ නොමැතිව පීඩාවට පත්ව සිටින අසරණ රෝගීන්ට සහන සැලසීමේ කඩිනම් වැඩපිළිවෙළක් දියත් කිරීමට අප සංගමය පියවර ගෙන ඇත. අවසාන වශයෙන් ජාති, ආගම් කුළ බේද මතුකරමින්, අද ගොඩ නැගී ඇති ජතික සමගිය බිද දැමීමට වෙරදරන කඩාකප්පල්කාරි ක්‍රීයා අප සංගමය ඉතාමත් පළිතුලෙන් හෙලා දකින බවද මහිදී සිහිපත් කර සිටිමු.

විධායක කමිටුව
බර්ලින් ශ්‍රී ලංකෙ සංගමය

2022 අප්‍රියෙල් මස 19 දින

**Gardeschützenweg 86, 12203 Berlin | www.srilankans-berlin.de | e-mail: info@srilankans-berlin.de**
Bankverbindung: Commerzbank AG | IBAN: DE83 1008 0000 0312 9366 00 | BIC: DRESDEFF100
Gerichtstand: Amtsgericht Berlin Charlottenburg | 95 VR 6170 NZ